# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024**
**2026 ජූලි / අගෝස්තු**

**සමාජීය විද්‍යා පීඨය**

## මනෝවිද්‍යාව

**පෞරුෂය පිළිබඳ මනෝවිද්‍යාව - PSYC 18224**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. පෞරුෂය නිර්මාණය වීම කෙරෙහි බලපාන තීරණාත්මක සාධක (Determinants of Personality) පැහැදිලි කරන්න.

02. "පුද්ගල පෞරුෂය පිළිබඳ අවබෝධය සමාජීය පැවැත්ම පහසු කරයි." මෙම අදහස සනාථ කරන්න.

03. සාර්ථක පෞරුෂයක් තුළ දැකිය හැකි ලක්ෂණ අවම වශයෙන් පහක්වත් (05) විස්තරාත්මකව ඉදිරිපත් කරන්න.

04. පෞරුෂය හඳුනා ගැනීම සඳහා කාල් රොජර්ස්ගේ පුද්ගල කේන්ද්‍රීය සංකල්ප භාවිතා කළ හැකි ආකාරය පෙන්වා දෙන්න.

05. පුද්ගල පෞරුෂ සංවර්ධනය කෙරෙහි බලපාන මනෝභෞතික සාධක (Psycho-physical factors) හඳුන්වා දෙන්න.

06. පුද්ගල පෞරුෂත්වයේ ස්වභාවය අනාවරණය කරන සාධකයක් ලෙස කායික හැඩය භාවිතා කළ හැකි බව විලියම් ෂෙල්ඩම්ගේ ගති ලක්ෂණ න්‍යාය ඇසුරින් පැහැදිලි කරන්න.

07. පුද්ගල පෞරුෂත්ව ගැටලු අවම කර ගැනීම සඳහා ව්‍යවහාරික සංදර්භය තුළ භාවිත කළ හැකි මනෝවිද්‍යාත්මක ක්‍රමශිල්ප මොනවාද යන්න සාකච්ඡා කරන්න.

08. පුද්ගලයෙකුගේ ආශාවන් අතෘප්තිකර මට්ටමක පැවතීම පෞරුෂ සංවර්ධනයට කරන බලපෑම මනෝවිශ්ලේෂණවාදය ඇසුරින් ඉදිරිපත් කරන්න.

********************************